දුරකථන/ தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය

கல்வி அமைச்சு

Ministry of Education

'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபு
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

මගේ අංකය / எமது இல. / My No. ED/9/9/1/1/2

දිනය / திகதி / Date 2017.10.6

චක්‍රලේඛ අංකය : 38 /2017

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

අධ්‍යාපන කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

ප්‍රාථමික පන්ති පැවැත්වෙන සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## තුන්වන ශ්‍රේණිය සඳහා 2018 වර්ෂයේ සිට නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම

1998 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ 2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාථමික අධ්‍යාපන නවීකරණ තවදුරටත් ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම අරමුණු කරමින් තුන්වන ශ්‍රේණිය සඳහා දැනට භාවිත වන විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, පෙළපොත් හා වැඩපොත් මෙම වර්ෂයේදී සංශෝධනය කරනු ලැබ ඇත. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නිකුත් කරන ලද අංක 2007/29 හා 2007.12.13 දිනැති චක්‍රලේඛයට අමතර වශයෙන් 2018.01.01 දින සිට බලාත්මක වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. ඒ අනුව ඉහත චක්‍රලේඛයේ අංක 1, 9, 10 සහ 11 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

i. අංක 1 - 2018 වර්ෂයේ සිට තුන්වන ශ්‍රේණිය සඳහා සංශෝධිත විෂයමාලාව ක්‍රියාත්මක කළ යුතු වේ.

ii. අංක 9 හා 10 - මෙතෙක් භාවිත කළ තුන්වන ශ්‍රේණියේ විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ වෙනුවට සංශෝධිත නව විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතු ය.

iii. අංක 11 - මෙම නව විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශවලට අනුකූල ව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කර ඇති තුන්වන ශ්‍රේණියේ පෙළපොත් හා වැඩපොත් 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ යුතු ය. තුන්වන ශ්‍රේණියේ ගණිතය විෂය සඳහා ගණිතය I සහ ගණිතය II ලෙස පොත් දෙකක් සකස් කර ඇත. එයින් ගණිතය I කොටස වැඩ පොතක් ලෙස සකස් කර ඇති බැවින් එහි සඳහන් අභ්‍යාස එම පොතෙහි ම සිදු කිරීමට සිසුන් යොමු කළ යුතු ය.

මීට අමතරව 2007.12.13 දින නිකුත් කරන ලද අංක 2007/29 චක්‍රලේඛයට අලුතින් අංක 13 හා 14 ලෙස පහත උපදෙස් ඇතුළත් කරනු ලැබේ.

13. 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන තුන්වන ශ්‍රේණියේ නව විෂය නිර්දේශවලට අදාළ තක්සේරු උපකරණ භාවිත කරමින් සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සිදුකළ යුතු ය.

14. තුන්වන ශ්‍රේණියට හඳුන්වා දී ඇති නව විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී සිසුන්ට ගෙදර වැඩ පැවරීම අවම විය යුතු ය. සතියේ දිනවල ගෙදර වැඩ පැවරීම අත්‍යවශ්‍ය අවස්ථාවක පමණක් ම සිදු කළ යුතු අතර සති අන්තයේ දී ද ගෙදර වැඩ පැවරීම කළ යුතු වන්නේ ඉතා සීමිත ව පමණක් බව අවධාරණය කරමි.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
2. කොමසාරිස් ජනරාල් - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
3. කොමසාරිස් ජනරාල් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව